# රත්නපුර නගරයේ පාරිසරික සෞඛ්‍ය ගැටලු පිළිබඳ විශ්ලේෂණයක්

**පී. පී. ලියනරත්න[1] අර්. එම්. කේ. රත්නායක[2]**
**[1]ඉඩම් පරිහරණ සැළසුම් දෙපාර්තමේන්තුව, රත්නපුර; [2]භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
***ratnayake.rmk@gmail.com***

කොළඹ නගරය හා මහවැලි කලාපය කේන්ද්‍රකොටගෙන පාරිසරික සෞඛ්‍ය ගැටළු අධ්‍යයනය කර ඇතත් දිවයිනේ සෙසු නගරවල එවැනි ගැටළු හඳුනා ගැනීම අභියෝගයක් ව පවතී. එනිසා ආපදා තත්ත්වයන් සහ පාරිසරික සෞඛ්‍ය ගැටළු බහුල නගරයක් වශයෙන් රත්නපුර නගරය ඇසුරින් නාගරික පාරිසරික සෞඛ්‍යය පිළිබඳ ව ශ්‍රී ලංකාවේ වෛද්‍ය භූගෝල විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය පුළුල් කිරීමට දායක වේ.

කාලික *(Temporal)* හා *(Spatial)* වශයෙන් රත්නපුර නගරයේ වාණිජ කලාපය තුළ පවත්නා පාරිසරික ගැටළු හඳුනා ගැනීම, සනීපාරක්ෂක පහසුකම් ප්‍රමාණවත් වේ දැයි පරීක්ෂා කිරීම, ආපදා අවස්ථාවලදී සිදුවන බලපෑම් අධ්‍යයනය කිරීම, රෝග වැලඳීමේ අවදානම සහ පාලනය කිරීමේ ක්‍රමවේදයන් විවේචනාත්මකව පරීක්ෂා කිරීම මෙහිදී වැදගත් වේ. ඉතා පටු නිම්න ප්‍රදේශයක පිහිටි රත්නපුර නගරයේ වැඩිවන ජනගහනයත් සමග මිනිස් භූමි අනුපාතය ක්‍රමිකව කුඩා වී ඇත. මේ නිසා ජනගහනයට සමානුපාතිකව භූමිය ප්‍රමාණවත් නොවීම, පැරණි නගරයේ ම තවදුරටත් නේවාසික හා වාණිජ කටයුතු න්‍යෂ්ටිගතව පැවතීමද දෛනික ජන සංක්‍රමණ නගරය තුළ පැවතීම, විධිමත් කැළි කසළ හා මළ අපද්‍රව්‍ය බැහැර කරන කාණු පද්ධතියක් හා ක්‍රමවේදයක් නගරය තුළ ක්‍රියාත්මක නොවීම, විධිමත් කැළි කසළ හා ඝන අපද්‍රව්‍ය බැහරලන ක්‍රමවේදයක් හා ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලියක් නගරය තුළ නොපැවතීම හා ඒ සඳහා අවශ්‍ය භූමිය ප්‍රමාණවත් නොවීම, නගරය තුළ අක්‍රමවත් හා නීති විරෝධී ගොඩ කිරීම් පැවතීම නිසා නාගරික ප්‍රජාව හා නාගරික දේපළ ගං වතුර ආපදා තත්ත්වයන්ට ලක්වීම, සෞඛ්‍ය සේවා පහසුකම් ප්‍රමාණවත් නොවීම, නාගරික සෞඛ්‍ය අංශය හා රෝහල් සේවාව ඒකාබද්ධ ව ක්‍රියාත්මක නොවීමෙන් වගකීම් දරණ කණ්ඩායම නිශ්චිතව හඳුනාගත නොහැකි වීම, රෝහල් හෙද සේවය පිළිබඳ ව නාගරික ප්‍රජාව තුළ පවතින ඍණාත්මක ආකල්ප, නාගරික ප්‍රජාව තුළ පාරිසරික සෞඛ්‍ය හා සෞඛ්‍ය සේවාවන් පිළිබඳ ව දැනුවත් භාවයේ පවතින විෂමතාව යන කරුණු රත්නපුර නගරයේ පාරිසරික සෞඛ්‍ය ගැටළු ශීඝ්‍රයෙන් වර්ධනය වීමට බලපා ඇත.

එසේ ම මෙම ආපදා බහුලව ම පවතින නාගරික කොට්ඨාසවල පදිංචි පවුල්වලින් 5% ක නියැඳියක් සමීක්ෂණය සඳහා තෝරා ගන්නා ලදී. දත්ත රැස් කිරීමේදී ද්විතීයික දත්ත හා ප්‍රාථමික දත්ත යන දෙවර්ගය ම භාවිත කරන ලදී. ප්‍රාථමික දත්ත රැස්කිරීම ප්‍රධාන වශයෙන් ප්‍රශ්න මාලාවක් හරහා සහ නිරීක්ෂණය මගින් සිදුකළ අතර අර්ධ ව්‍යුහගත හා අවිධිමත් සාකච්ඡා ද ඒ සඳහා යොදා ගැනිණ. දත්ත විශ්ලේෂණය ගුණාත්මක හා ප්‍රමාණාත්මක යන ක්‍රමවේදයන් දෙක යටතේ ම සිදු කර ඇති අතර මීට අමතර ව සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්ප හා අවශ්‍ය ස්ථාන වල සහ ආපාදා අවස්ථා වලදී ලබාගත් ඡායාරූප ද දත්ත තහවුරු කිරීම සඳහා භාවිත කර ඇත.

ගංවතුර ආපදා තත්ත්වය පාලනය කිරීම, අනවසර පදිංචිකරුවන් හා අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස ව්‍යාපෘතියක් ඇති කිරීම, කැළි කසළ හා මළ අපද්‍රව්‍ය බැහැර ලීම සඳහා වඩා දියුණු ක්‍රම වේදයන් හා ප්‍රතිචක්‍රීකරණ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම,සෞඛ්‍ය සේවා පහසුකම් සැපයීම සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල දායකත්වය ලබා ගැනීම, කැළි කසළ බැහැර කිරීම සහ ඉඩම් ගොඩ කිරීම් සම්බන්ධයෙන් දැනට ක්‍රියාත්මක වන රජයේ නීතිරීති තවදුරටත් ශක්තිමත් කිරීම රෝහල් හා නාගරික සෞඛ්‍ය සේවා අංශ දෙක ආයතනික වශයෙන් ඒකාබද්ධ කොට කාර්යක්ෂම සේවාවක් ඉටු කිරීම යන යෝජනා මෙම හඳුනා ගත් නාගරික පාරිසරික සෞඛ්‍ය ගැටළු අවම කිරීමට ගත හැකි ක්‍රියා මාර්ග වශයෙන් හඳුන්වා දිය හැකිය.

***ප්‍රමුඛ පද*** *: නාගරික පරිසරය, නාගරීකරණය, පාරිසරික සෞඛ්‍ය, උපද්‍රව, සෞඛ්‍ය ගැටලු*